**හොරණ ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හොරණ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 දක්වා සඳහන් ඡේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශන නිවැරදිව සකස් කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 හා 2021 වර්ෂයන්හිදී ලද පුනරාවර්තන නොවන වියදම් සඳහා වූ රජයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් අදාල වත්කම් ක්ෂය කළ ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් එනම් රු.4,705,208 ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ පැවරුම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එම අගය රු.2,672,330 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදිව සකස් කරන බව. | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2020 ජනවාරි 01 දින ප්‍රත්‍යාගණිත වටිනාකම රු.5,750,000 ක් වූ කම්පැක්ටර් රථයේ වටිනාකම රු.12,422,650 ලෙස ගිණුම්ගත කර තිබූ අතර එදිනට ප්‍රත්‍යාගණිත වටිනාකම රු.900,000 ක් වූ ත්‍රිරෝද රථය හා පිරිවැය රු.308,000 ක් වූ ට්‍රේලරය වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ස්ථාවර වත්කම් නිවැරදිව වටිනාකමට ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය නිර්දේශ මත ඉවත් කරන ලද එකතුව රු.1,049,146 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | -එම- | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල පෝරුවදණ්ඩ ආයුර්වේදයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරි සඳහා නිල කාමරයක් සැකසීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වීමක් පමණක් තිබුණද, ඒ සඳහා රු.275,000 ක ණයහිමි ප්‍රතිපාදන වෙන් කර එම වටිනාකම වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන් නොකළ යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 (අ)වගන්තිය. | වරිපනම් හිමියන් 3,029 ක ගෙන් වර්ෂ 01-10 අතර කාලයක සිට අයවිය යුතු හිඟ සම්බන්ධයෙන් අවසන් පියවර ලෙස දේපළ තහනම් කිරිම කර නොතිබුණි. | 2023 වර්ෂයේදී දේපල තහනම් කිරිමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති බව. | ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ඉදිරි වර්ෂ සඳහා එම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති මුල්‍ය නොවන වත්කම් තක්සේරු කිරිමේ මාර්ගෝපදේශය | ඉඩම් හා ගොඩනැගිලි වෘත්තීය තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කරවා ගතයුතු වුවත්, සභාව විසින් පත්කළ කමිටුවක් මගින් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරුව සිදු කර තිබුණි. | ඉඩම් තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්මේන්තුව වෙත යොමු කර ඇති අතර ගොඩනැගිලි තක්සේරුව 2019 වර්ෂයේදී ආදායම් පරික්ෂකවරුන් විසින් සිදු කර ඇති බව. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු දෙපාර්මේන්තුව ලවා තක්සේරු කරවා ගත යුතුය. |

2. **මුල්‍ය සමාලෝචනය**

**2.1 මුල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.135,849,195 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.108,625,098 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,152,892 | 18,036,889 | 31,987,194 | 8,457,587 | 11,599,001 | 18,073,742 | 23,509,376 | 7,759,879 |
| (ii) | කුලී | 2,291,600 | 2,002,040 | 2,276,540 | 20,500 | 3,617,100 | 1,976,740 | 3,838,362 | 82,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,761,000 | 1,297,879 | 2,552,803 | 34,000 | 2,763,100 | 1,661,100 | 2,092,343 | 171,921 |
| (iv) | වෙනත් ආදායම් | 172,829,537 | - | 170,939,034 | - | 120,444,398 | - | 108,792,183 | - |
| | | 196,035,029 | 21,336,808 | 207,755,571 | 8,512,087 | 138,423,599 | 21,711,582 | 138,232,264 | 8,014,300 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01-03 කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 1,479 කින් රු.3,403,957 ක් ද, වර්ෂ 03-05 අතර ඒකක 1,042 කින් රු.3,259,491 ක් ද ,වර්ෂ 05-10 අතර ඒකක 439 කින් රු.1,113,624 ක්ද,වර්ෂ 10 ට වැඩි කාලයක සිට පැවත එන ඒකක 79 කින් රු.244,552 ක හිඟයක් ද පැවතුණි. | දේපළ තහනම් කිරීමේ ක්‍රියාවලිය යටතේ වසර 05 ට හා වසර 03 ට වඩා වැඩි හිඟ තිබෙන දේපල සඳහා විනිශ්චය බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.31,122,097 ක් හා මුද්දර ගාස්තු රු.180,016,955 ක් විය. | නැවත අයකර ගත නොහැකි උසාවි දඩ රු.16,122,097 ක් කපා හැරිය යුතුය. මේ වන විට රු.118,106,387 ක මුද්දර ගාස්තු සභාව වෙත ලැබී ඇති අතර, අනෙකුත් හිඟ මුදල් වලට අදාල උපලේඛන සකස් කරමින් පවතින බව. | අදාල උපලේඛන කඩිනමින් සකස් කර ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුළ පවතින සුසානභූමි 33 ක් සභාව වෙත පවරාගෙන නොතිබුණු අතර ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා වැට මායිම් සකස් කර නොතිබුණි. | සුසානභූමි පවරා ගැනීම සම්බන්ධව කටයුතු සිදු කරමින් පවතින අතර මෙතෙක් පවරා ගැනීම් සිදු කර නොමැති බැවින් එහි ආරක්ෂක කටයුතු සඳහා මුදල් යෙදවිය නොහැකි බව. | සුසානභූමි සභාව වෙත පවරා ගෙන වැට මායිම් නිරවුල් කර ගත යුතුය. |
| (ආ) | 2020 හා 2021 ආදායම් බලපත්‍ර ලබා ගත යුතු වාහන 09 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම නෛතික අවශ්‍යතාවය සපුරාලීමකින් තොරව ධාවනයේ යොදවා තිබුණි. | වාහන 04 ක් සඳහා මේවන විට ආදායම් බලපත්‍ර ලබාගෙන ඇත. ඉතිරි වාහන 05 සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | සියළු වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන ධාවනයේ යෙදවිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 දෙසැම්බර් 09 දිනැති අංක 08/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින අළුත්වැඩියා කිරීම ඵලදායි වන වාහන අළුත්වැඩියා කර භාවිතයට ගතයුතු වුවත් පොකුණුවිට උපකාර්යාලයේ ඇති ට්‍රැක්ටර් රථ 02 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | රථ පරික්ෂා කර බලා අළුත්වැඩියාව සඳහා යොමු කිරීමට කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |